**මියුසියස් විද්‍යාලය**
**නො.58, රොස්මිඩ් පෙදෙස, කොළඹ 07.**
**දු.ක. 011 2695048**

2021.01.04

**මියුසියස් විද්‍යාලයීය වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2021.01.20 වැනි බදාදා දින පාසල් පරිශ්‍රයේ දී පැවැත්වේ. ඔබ ත්‍යාගලාභිනියක බැවින්, <u>ත්‍යාග ප්‍රදානෝත්සවය හා සම්බන්ධ පහත දී ඇති උපදෙස් ගැන ඔබගේ ප්‍රවේසම් සහගත අවධානය යොමු විය යුතුය.</u>**

- **ත්‍යාග ප්‍රදානෝත්සවය පැවැත්වෙන්නේ <u>වාහනයෙන් පැමිණ ත්‍යාගය රැගෙන යාම එනම්, "Drive Through" ක්‍රමයට ය.</u>**

- **ඔබට පාසලෙන් දෙන " නොම්මරය" වාහනයේ ඉදිරිපස වීදුරුව " wind screen" තුලින් A4 ප්‍රමාණයේ කොලයක පැහැදිලිව දැක්විය යුතුය.**

- **ඔබ බාන්ස් පෙදෙසෙන් පිවිස රොස්මිඩ් පෙදෙසෙන් පිටතට පැමිණිය යුතුය.**

- **ඔබ වාහනයෙන් බැස ත්‍යාගය ආරාධිතයා අතින් ගෙන ඡායාරූපයට පෙනී සිටීමෙන් අනතුරුව, නැවත වාහනයට පැමිණිය යුතුය.**

- **පාසල් භූමිය තුළට ඔබට දී ඇති වෙලාවට <u>විනාඩි 15කට පෙර</u> බාන්ස් පෙදෙසේ ගේට්ටුවෙන් ඇතුලු විය යුතුය.**

- **එකම පවුලේ සහෝදරියන් ත්‍යාගලාභිනියන් වන විට ඔවුන් එකම වේලාවකදී ත්‍යාග ලබා ගත යුතු අතර අදාළ ශ්‍රේණි භාර ගුරුතුමියන්ට දැනුම් දිය යුතුය.**

- **ඡායාරූප සඳහා අවශ්‍ය රු.200/- ක ආපන ශාලාව අසල සිටින නිලධාරියෙකුට ලබා දිය යුතුය.**

- **මෙය ඉතා දුෂ්කර කාර්යයක් බැවින් ඔබගේ උපරිම සහයෝගය මෙ සඳහා අපේක්ෂා කරමු.**

- **ඔබ එදිනට ඇඳිය යුතු ඇඳුම් පිළිවෙල**

    1. **4 වන ශ්‍රේණියේ සිය 12 වන ශ්‍රේණිය දක්වා ත්‍යාගලාභිනියන් පිරිසිදු පාසල් නිල ඇඳුම සහ නිවැරදිව ටයි පටිය ඇඳ කොණ්ඩය පිලිවලට කළු රිබන් පටි බැඳ පැමිණිය යුතුය.**
    2. **13 වැනි ශ්‍රේණිය සහ ඉන් ඉහල ත්‍යාගලාභිනියන්**

        i. ඔබ උත්සවයට සහභාගි විය යුත්තේ තනි සුදු පැහැති විනිවිද නොපෙනෙන සාරියකින් සහ එවැනිම විනිවිද නොපෙනෙන , නොගැඹුරු කර ඇති අත් සහිත සුදු පැහැති හැට්ටයකිනි.
        ( මෙම උත්සවයේ ගාම්භීරත්වය රැකෙන පරිදි ශිෂ්‍යාවන්ගේ ඇඳුම ඒකාකාරී විය යුතු බැවින් ඔබගේ හැට්ටය පහත සඳහන් පරිදි වන්නේ නම් මැනවි.)
        ii. කුඩා අඩි සහිත පාවහන් යුවළක් පළඳින්න.
        iii. සාරිය හෝ ඔසරිය ක්‍රමානුකූලව පිළිවෙළට ඇඳිය යුතුය.
        iv. යට සායද සුදු පැහැයෙන් යුක්තව නියමිත උසට තිබිය යුතුය.
        v. විසිතුරු ආභරණ පැළඳීමෙන් වළකින්න.
        v.හිසකෙස් වර්ණ නොගැන්විය යුතුය.
        vi. **හිසකෙස් තනි කොණ්ඩයක් වන සේ ගොතන්න.**

**විදුහල්පතිනිය.**
**නෙළුම් සේනාධීර මිය**